බක්මහ අකුණු

දයානන්ද ගුණවර්ධන

දෙවෙනි අංකය

ලමාතැනීගේ කාමරය (ලමාතැනී තනිව ගයයි)

මලකට වන් බඹරෙකු පැනි බොන්නේ
ඉන් පසු එම මල අතහැර යන්නේ
විලිකුන් පල වෙත සියොතුන් එන්නේ
එහි රස විඳ අන් පල වෙත යන්නේ
තුරුලිය සැනැසූ සඳු බැස යන්නේ
හිමිදිරි පිනි කඳුලින් දුක දෙන්නේ
හිමීගේ හදවත මා හැර යන්නේ
නිරුදක කතරක් මෙන් හද දන්නේ

(පබුලිනා පැමිනෙයි)

පබුලිනා : ලමාතැනීගෙ ඇස් දෙකේ කඳුලු පිරිල. අනේ මට නං තේරෙන්නේ නැහැ මොකද මේ දවස් ටිකේම මෙහෙම ඉන්නෙ කියල.

ලමාතැනී : මම කියන්න ඕනෑ නැහැ පබුලිනා උඹ දන්නවනෙ කියා පන් පබුලිනා කියාපන්, ඇත්තටම ඊයෙ වෙච්ච සිද්ධිය මොකක්ද කියල.

පබුලිනා : අනේ ඔන්න ලමාතැනීට කිව්ව, මට නං දැන් බෙරෙන්නම බෑ, මුදලි තුමා ගෙන්. මම ඒක තමා අරය එක්කල කිව්වෙ මම ඕනෑ මොහොතක පැනල යනව කියල හොරෙං.

ලමාතැනී : මොකද මුදලි තුමා කිව්වේ?

පබුලිනා : අනේ ලමාතැනී මට කට ඇරලවත් කියන්න බෑ.

ලමාතැනී : ඇත්තට.

පබුලිනා : මුදලිතුමා කියනව ජාසොන්ගෙ නය ගෙවන්නං කියල.....

ලමාතැනී : ඉතිං.

පබුලිනා : මල් වත්තෙදි හම්බ වෙන්න කියල.

ලමාතැනී : සල්ලි දෙන්නද?

පබුලිනා : ඉතින් මට බෙරෙන්න බෑ ලමාතැනී.

ලමාතැනී : අනේ පබුලිනා මට නං දැන් ජීවිතේ එපාවෙලා තියෙන්නෙ.

පබුලිනා : මුදලිතුමා හදනව අපේ කසාදෙ පරක්කු කරන්න කොහොම හරි, මුදලිතුමාගෙ අදහස් ඉස්ට වෙන කං.

ලමාතැනී : ඇත්තට?

පබුලිනා : හරියට බලමු නරක වෙලාවට මේ කරුණාවතීගෙ නයත් ඉස්මතු වෙලා ආ හැටි. මං හිතන්නෙ මුදලි තුමා කරුණාවතීව උසිගන්නල තියෙනව.

(ජාසොං එනු දැක)

පබුලිනා : අන්න අරයත් එනව.
ලමාතැනී : ජාසොං දන්නවද ඔව්ව.
පබුලිනා : ඇයි නැත්තේ.
ල්මාතැනී : එහෙනං ඔය සන්තෝසෙන් වාගෙ එන්නේ.

(ජාසොං ඇතුල්වෙයි)

ලමාතැනී : මොකද ජාසොං අද හරි සන්තෝසෙන්.
ජාසොං : සන්තෝස නැද්ද ලමාතැනි, මට ලොකු රස්සාවක් හම්බ වෙන්න යනවනෙ. උඩහ වතුවල කොන්දෙස්තර වැඩේ.
ලමාතැනී : පබුලිනත් එක්ක යනවද? එහෙ.
ජාසොං : නෑ එයා මෙහෙ තියල යන්නෙ.
ලමාතැනී : ඒ කද ඔය හැටි සන්තෝසෙ.
ජාසොං : නෑ එයා බලා ගන්න කෙනෙක් ඉන්නව නෙ.
ලමාතැනී : කව්ද?
ජාසොං : ඇයි මුදලිතුමා.
පබුලිනා : මොනවද මේ කතාකරන්නෙ.
ලමාතැනී : අනේ ජාසොං මට නං ඔව්ව මතක් කරන්නවත් එපා.
ජාසොං : බය වෙන්න එපා ලමාතැනි. මම හොඳ ප්ලෑන් එකක් හදල තියෙනව, මුදලිතුමා කරමුලින්ම අහුවෙන්න.
ලමාතැනී : (නොඉවසිල්ලෙන්) ජාසොං මොකක් ද ඒ.
ජාසොං : බය වෙන්න එපා ලමාතැනී. මුදලි තුමාට මම පෙන්නල දෙන්නං මුදලි තුමාට අයිති ලමාතැනිද නැත්නං පබුලිනාද කියල.
ලමාතැනී : ජාසොං මොකක් ද කියාපං.
පබුලිනා : අද ඒ ප්ලෑන් එකේ මුල් පියවර ගත්ත.
පබුලිනා : මොනව.
ජාසොං : ඔන්න මම කැලෑපත්තරයක් තැපැල් කලා මුදලි තුමාට ලැබෙන්න. ලමාතැනී වෙන කෙනෙක් එක්ක ඉන්නව කියල කාමරේ මුදලිතුමා අද පන්සලේ මුල් ගල් තියන උත්සවේට ගිය අතරේ.

ලමාතැනී : (නොසතුටෙන්) ජාසොං මොනවද උඹ කලේ.
ජාසොං : බය වෙන්න එපා ලමාතැනී සේරම හරියට කෙරෙයි.
ලමාතැනී : මොනව ජාසොං උඹ මට මොකද කරන්න යන්නෙ.
ජාසොං : මේ අහන්න ලමාතැනි. මුදලි තුමා කලබල වෙච්ච තරමට හොඳයි. කලබල උනහම මුදලිතුමා සේරම අවුල් කර ගන්නව. එතකොට අපිට පුළුවනි. ඉක්මනට වලව්වෙන් යන්න. එතකොට සේරම කලබල ඉවරයි.
ලමාතැනී : මේක ජාසොං ලියපු ධව දැන ගත්තොත් වෙඩි තියයි. අපොයි මොකද මේ වෙන්න යන්නෙ වලව්වට!
ජාසොං : ලමාතැනි කලබල වෙන්න එපා. ජාසොං අඳුරන්නෙ නැද්ද? මම හරියට වැඩේ කරල ඇති. මෙන්න අහන්න ප්ලැන් එක. පබුලිනාට කියනව මුදලිතුමාට කියන්න කියල අද රෑ මුදලිතුමාව හම්බවෙන්න එනව කියල මල් වත්තෙදි. ප්‍රේමදසව අන්දල අරිනව පබුලිනා වගෙ.
ලමාතැනී : ප්‍රේමදස ඉන්නවද?
ජාසොං : ඔව් ඉන්නව. මම තියාගත්ත මේ ප්ලැන්. එකට ඉතිං ලමාතැනිට පුළුවනි හරියට ඒ වෙලාවෙදී මුදලිතුමාව අල්ල ගන්න.
ලමාතැනී : ජාසොං ඇත්තට ම මේක හරියයි ද?
ජාසොං : කිරිගහට ඇන්න වගේ – මුදලිතුමා දන් වල්වේ නැනෙ පන්සලේ මුල් ගල් තියන උත්සවයට ගිහින්. මම ප්‍රේමදසව එවන්නං පබුලිනාගේ ඇදුම් අන්දල කාමරේකට දල හංගල තියන්න. පබුලිනා ඔයාගෙ ඔය අහර දහර ටිකක් උගන්නන්න ඕනෑ.
(පිටවෙයි)
පබුලිනා : ප්‍රේමදස බිල්ලට දෙන්නද දන්නෙ නෑ මේ නාඩගම නටන්න යන්නෙ. අනේ අසරණය එදා මට සිංදුවක් කිය කියා හිටිය වෙලාවෙ තමයි ඔන්න ඔය කලබලේ ඇති උනේ.

(ප්‍රේමදස ඇතුල්වෙයි)

ලමාතැනී : ආ ප්‍රේමදස දැන් සිංදු කියනව කියල ආරංචියි.බැරිදසිංදුවක්කියන්නඔටත්.
ප්‍රේමදස : මට බයේ බෑ සිංදුවෙ අඩට එද වගෙ මුදලිතුමා එයිද කියල.

පබුලිනා : මුදලිතුමා එන්න තමා ලෑස්තිය අද ප්‍රේමදස ලඟට.

ප්‍රේමදස : අනේ පබුලිනා අක්කෙ ඇත්තටම මොකක්ද මේ කරන්න යන්න හදන්නෙ.

පබුලිනා : බය වෙන්න එපා ප්‍රේමදස..... මොකක් හරි උනොත් ප්‍රේමදස විතරක් නෙමෙ අහුවෙන්නෙ අපි සේරම.

ලමාතැනි : අනේ පබුලිනා ඇත්තටම මේ විදියට ඇන්දෙයිය හැකි ද පබුලිනාවගෙ ප්‍රේමදසව.

පබුලිනා : ඇයි බැරි ඉන්නකොං මම පටන් ගන්න.

ලමාතැනි : පබුලිනා මේ කවුරුහරි ආවොත්.

පබුලිනා : හිටින්න මම දෙරට යතුරු දන්න.

(දෙරවල් වසයි)

ලමාතැනි : කෝ බලන්න ප්‍රේමදසට දුන්න ලියමන මුදලිතුමා මක්කියලද දන්නෙ නෑ ලියල තියෙන්නෙ.

ප්‍රේමදස : මෙන්න ලියන මහත්තය දුන්න ලියමන.

ලමාතැනි : ආ කෝ ඒකෙ මුදලිතුමා අත්සන් කරලවත් නෑ..... බලමු. හදිස්සියට කරල තියෙන වැඩ. මේක පරෙස්සමෙන් තියාගන්න.

පබුලිනා : කෝ කමිසෙ ගලවන්න ප්‍රේමදස මේ හැට්ටෙට අන්දවන්න. (කමිසය ගලවයි) මොකද මේ අතේ තුවාලයක්.

ප්‍රේමදස : ඊයෙ මගෙ අත තුවාල උනා,

ලමාතැනි : මගෙ සාය පටියෙන් නේ ද මේ බැඳල තියෙන්නෙ ඇයි පබුලිනා තෙල්ටික්ක් ගෙනෙං මේකට දන්න.

ප්‍රේමදස : ලමාතැනි තෙල් ඕනෑ නැහැ මේකෙන් සනීපවේවි.

ලමාතැනි : නිකං සනීප වේවිද?

ප්‍රේමදස : ලෝකෙ තියෙන මොන බෙහෙතකටවත් වැඩිය බලයක් තියෙනව මේකෙ ඔබ තුමියගෙ සාය පටියෙ.

ලමාතැනි : පබුලිනා අර හවරියක් අරං වරෙං මේ කොන්ඩෙ හදන්න.....

(පබුලිනා ඇගේ කාමරයට යයි)

ලමාතැනි : ප්‍රේමදසගෙ කෝ කොන්ඩෙ පීරන්න. .....ඉසකෙස් හරි ලස්සනයිනෙ මටත් උගන්නන්න බැරිද ඉසකෙස් ලස්සන කරගන්න හැටි.

ප්‍රේමදස : ලමාතැනිගෙ ලස්සන රූපෙ දිහා බලා ඉන්නකොට මාෑ ලස්සන, වෙනව. ඔබ තුමීගෙ නිල්පාට ඇස් දෙකෙන් මගේ ඇස් දෙක දිහා බැලුවොත් මගේ ඇස් දෙකත් නිල් පාට වෙනවා.

ලමාතැනි : ප්‍රේමදස හරි කවි කාරයෙක්නෙ ප්‍රේමදස අර මට හැදුවයි කිව්ව කවියක් දෙන්න බලන්න.

ප්‍රේමදස : මෙන්න ලමාතැනි (කඩදාසියක් දෙයි)

ලමාතැනි : හරි ලස්සන කවියක්නෙ. අපි දෙන්න කියමු බලන්න.

ප්‍රේමදස : දියට නැමුනු මල් පවනට හැලිලා
පෙන පිඬු සමඟින් පාවෙන්නේ

පුළුන් වලා මත සඳරැස් වැටිලා
සුලන් සමග විසිරී යන්නේ

දියඹ නැගෙන රැලි දියමත හැපිලා
දියකඳ දස අත පැතිරෙන්නේ

ලොවේ මිහිර දැතින් නොලබාලා
සුසුම් කිකල සැනසුම දෙන්නේ

(මේ අතර මුදලි තුමා දෙරට තට්ටු කරන ශබ්දය ඇසේ)

මුදලි : දෙර අරින්න.....ඇයි මේ දෙරට යතුර දල තියෙන්නෙ.

ලමාතැනි : (කලබලවී) දෙයියනේ මොකද මේ උනේ මුදලිතුමා නේද.

ප්‍රේමදස : මුදලි තුමා! අනේ ලමාතැනි මං නං ඉතුරු කරන එකක් නැහැ.

ලමාතැනි : ප්‍රේමදස එක්ක ඉන්නව හෙම අහුඋනොත් දෙයියනේ, අනික ජාසොන්ගෙ ලියමනට නිව්වියටම ගිනි පත්තු වෙලා ඇති.

මුදලි : මොකද දෙර වහගෙන.

ලමාතැනි : ඒකනේන්නං දෙර වැහිලද කොහෙද.

මුදලි : ඉඹේම වැහිල.

ලමාතැනි : හුළඟට වෙන්නැති. ප්‍රේමදස හැංගියයන්. අපොයි ඇහේ හරි හමනක්කේ රෙද්දක්වත් නෑ! මං දන්නෙ නෑ.

මුදලි : කවුද ඕක ඇතුලේ ඉන්නෙ.

ලමාතැනි : කව්රුවත් නෑ මම තනියම.

ප්‍රේමදස : (බියෙන්) මාව මරයි.

මුදලි : කා එක්කද එහෙනං ඕය කතා කරන්නෙ.

ලමාතැනී : කව්රුත් නෑ මම තනියම.

ප්‍රේමදස : (බියෙන්) මාව මරයි.

මුදලි : කා එක්කද එහෙනං, ඔය කතා කරන්නෙ?

ලමාතැනී : දෙයියනේ කා එක්කවත් යැ ඔයා එක්කනෙ කතා කරන්නෙ

(ප්‍රේමදස කාමරයට දමා වසයි. මුදලිට දෙර අරියි. මුදලි පරීක්ෂා කරමින් ඇවිදියි.)

ලමාතැනී : අද ටිකක් උස්නයි නේද?..... අනේ මන්ද ජනේලෙං බලන්න ඕනෑ බීරං කරන වද කියල.

මුදලි : නෑ එහෙම ගතියක් නං නෑ මම මේ එලියෙ ඉඳල ආවෙ.

ලමාතැනී : ඒක නේන්නං.....මං හිතන්නෙ මේ කාමරේ උස්න හින්ද වෙන්න ඇති මේ දෙර වහල තිබුන හින්ද

මුදලි : ලමාතැනී මොකද දෙර වහගෙන උන්නෙ.

ලමාතැනී : ඒක නේන්නං අපි අඑත් රෙදි වගයක් ඇඳ ඇඳ හිටිය.

මුදලි : අපි කිව්වෙ.

ලමාතැනී : මේ පබුලිනයි මායි.

මුදලි : කෝ පබුලිනා.

ලමාතැනී : ඒක නේන්නං පබුලිනා ගියා ඇගෙ කාමරේට.

මුදලි : ඉතිං ඕකටද කාමරේ යතුර දගෙන උන්නෙ? වෙනද ඔහොම කරනවද?

ලමාතැනී : ඒක නේන්නං.

මුදලි : ඒක නේන්නං, ලමාතැනී දැක්කද මේ මට එවල තියෙනව කව්ද කැලෑ පත්තරයක්. බලන්න මේක කියවන්න තේරෙනවද බලන්න.

ලමාතැනී : ඒක නේන්නං කෝ බලන්න.

(ප්‍රේමදස සැහ වී සිටින කාමරයෙන් මේ අතර සබ්දයක් ඇසෙයි.)

මුදලි : (කලබලවී) මොකක්ද ඒ සද්දෙ.

ලමාතැනී : සද්දයක්? මට ඇහුනෙ නෑ.

මුදලි : එහෙනං ලමාතැනී වෙන එකක් ගැන කල්නාවෙන් වෙන්නැති.

ලමාතැනී : වෙන එකක් ගැන.

මුදලි : කව්ද ඉන්නව ඒක ඇතුලෙ.

ලමාතැනී : කව්ද?

මුදලි : මාත් අහන්නෙ කව්ද කියල.

ලමාතැනී : ඒක නේන්නන් ඒ අර පබුලිනා වෙන්නැති. ඒක ඇතුලෙ ඇදුම් මාරු කරනවද කොහෙද.

මුදලි : එහෙනං මේ ටිකකට ඉස්සර වෙලා කිව්වෙ පබුලිනා ගියේ පබුලිනාගෙ කාමරේට කියල.

ලමාතැනී : ඒක නේන්නං මං හිතන්නෙ පුටුවක් උඩට නගින්න ඇති. ඒකයි පෙරලෙන්න ඇත්තෙ.

මුදලි : පුටු උඩට නගින්නෙ මොකටද ඇදුම් මාරුකරන්න..... කෝ බලන්න කාමරේ දෙර අරින්න මට අවිශ්වාසයි මොකද මේ සේරම කියල.

(පබුලිනා ඇතුල්වෙයි. සිද්ධිය දැක පුදුම වී සැහවෙයි.)

ලමාතැනී : වී ලැජ්ජ නැද්ද ඔයාට ගෑනුංගෙ කාමරවලට යන්න රෙදිමාරු කරනව බලන්න.

මුදලි : රෙදි මාරුකරනවද වවන මාරු කරනවද කියල බලන්නයි මට ඕනෑ.

ලමාතැනී : ඔව් මං දන්නව ඔයාට හැම තිස්සෙම පබුලිනා බලන්න ඕනැබව.

මුදලි : මට ඕනෑ මේ අමුතු පබුලිනා කව්ද කියල බලන්න.

ලමාතැනී : එපා දෙර අරින්න. ඇහුනද ඔයාට. මගෙ කාමරේ මේක.

පබුලිනා : (ඉවතට) දෙයියනේ මේ මොකද වෙන්න යන්නෙ. මහ විලං බීතයක් මේ වෙලා තියෙන්නෙ. දෙයියනේ අරයගෙ ප්ලෑන තමයි ප්ලෑන! හරි මට තේරෙනව මොකද වෙලා තියෙන්නෙ කියල.

මුදලි : නෑ මම අරිනව.

ලමාතැනී : බෑ අරින්න. යතුර මාගාව.

මුදලි : යකාගෙ වැඩක්නෙ! මම කතා කරනව මිනිසුන්ට දෙර කඩන්න කියල..... ආරංචියි.

ලමාතැනී : වී ලැජ්ජ නැද්ද ඔයාට මහ කලබලකරල වලව්වෙ කතා ඇති කරන්න. එපා කෝලං කරන්න.

මුදලි : මටත් ඕනෑ කරන්නෙ මේ කෝලම මොකක්ද කියල දැනගන්න. දෙනවද නැද්ද යතුර.

ලමාතැනී : නෑ.

මුදලි : හොඳයි මම දෙර කඩන්නං කෝ. කෝ මේ දෙරවල් සේරම වහන්න. හරි යං මාත් එක්ක. නාරාස්සනෙ අරං එන්න.

ලමාතැනි : අනේ මොකද මේ ඔයාට මොනව වෙලාද!

මුදලි : මටද ඔයාටද වෙලා තියෙන්නෙ කියල අපි බලමුකෝ.....(පිටවෙයි)

පබුලිනා : (සැහවුන තැනින් ඉවතට විත්) මුදලි තුමාට ජයගන්න දෙන්නෙ නෑ මේ පබුලිනා ඉන්නකං මං ලමාතැනි පෙන්නපු විදියට වැඩ හරි ගස්සන්නං කෝ..... ඒයි ප්‍රේමදස ඉක්මනට දෙර ඇරගෙන වරෙං..... යම රජ්ජුරුවොා නොවෙයි මේ කථා කරන්නෙ පබුලිනා. (ප්‍රේමදස එයි.)

ප්‍රේමදස : පබුලිනා අක්කෙ මම ඉවරද?

පබුලිනා : නෑ යකෝ ඉක්මනට මෙතනිං පලයං

ප්‍රේමදස : දෙරවල් වහල.

පබුලිනා : පැනපිය ජනේලෙං..... ඕනෑ දිහාකිං ඉක්මනට

(ප්‍රේමදස ජනේලෙං පනියි)

පබුලිනා : පරලෝකෙට ගියාද දන්නෙ නෑ, ... නෑ..... දෙයියනේ අන්න පනපිටින් දුවනව..... හරි දැං ඉතිං දෙර කඩාපුහම ඉන්නෙ පබුලිනා

(පබුලිනා කාමරයට වී දෙර වසා ගනියි. මුදලි නාරස්සනය ගෙන ලමාතැනි සමග ඇතුල්වෙයි.)

ලමාතැනි : අනේ දෙයියනේ අනේ එපා අනේ.

මුදලි : මට කරදර කරන්න එපා තේරුනාද.

ලමාතැනි : හිටින්න කියන්න.

මුදලි : කව්ද ඉන්නෙ මේක ඇතුලේ ඇන්න කියන්වද.

ලමාතැනි : පබුලිනා නෙමේ.

මුදලි : පබුලිනා නොවේ. ඔය තියෙන්නෙ කව්ද..... කව්ද

ලමාතැනි : නිකං අපි බොරුවට දෙර වහල තිබ්බෙ පොඩි විහිලුවක් කරන්න ..... කව්රුවත් නෑ.

මුදලි : එහෙනං හොල්මන් වෙන්න ඇති ඒ සද්ද කලේ. මමත් ආසයි ඔය හොල්මන් බලන්න. කවදවත් දැකල නෑ.

(නාරස්සනය උලුක් කරයි)

ලමාතැනි : ඒකෙ ඉන්නෙ.....

මුදලි : ඔව් .....

ලමාතැනි : අනේ හරිම අහිංසකයි. කිසිවරදකට නෙමේ ආවේ.

මුදලි : මම මරනව. ඕක කව්ද?

ලමාතැනි : ලොකු මිනිහෙක් නොවේ. ළමයෙක්.

මුදලි : (පුදුම යි) ළමයෙක්.

ලමාතැනි : ඔව්! ගෙදර හිටපු.

මුදලි : ගෙදර හිටපු.

ලමාතැනි : අනේ! වැරැද්දක් නැති අහිංසකයෙක්, අනේ! ප්‍රේමදස.

මුදලි : ප්‍රේමදසයා.

ලමාතැනි : අනේ අහිංසක කොළුවා,

මුදලි : හනේ! හනේ! මා වලව්වෙන් පැන්නූ එකා මේක අස්සෙ තියාගෙන ලමා තැනි!! මොකද උෆට ඔය හැටි තියෙන අනුකම්පාව. ඒකද අද මා එක්ක උන්සවේට ආවෙ නැත්තෙ? ගෙදර තනියම ඉන්න ඕනෑ කිවෙ ඕකටනේද සනීප නෑ කියල. එතකොට මේ ලියමන හරි.

ලමාතැනි : අනේ අපි නිකං හිටියේ. අනේ මේ කොළුවගෙ හරියට ඇඳුමක් වත් නැහැ ඇහේ.

මුදලි : මොනවා! ඇඳුමක්වත් නැහැ ඇහේ. ජේනවද ගිහින් තියෙන දුර.

ලමාතැනි : අනේ අපි නිකං විහිලු කරකර හිටියෙ.

මුදලි : විහිළු! ඇඳුම් නැතුව කරපු විහිළු බලන්නං කෝ මම.

ලමාතැනි : මං බොරු කියන්නෙ නැහැ. මෙන්න යතුර හැබැයි අනේ උෆට මොනවත් කරන්න එපා. ඔයාගෙ මට ආදරයක් තිබුනනං ඒ වෙනු වෙන් අනුකම්පා කරන්න. (යතුර දෙයි)

මුදලි : ආදරයක්! යනවද නැද්ද .....මොකටද උෆ ආපහු ආවෙ වලව්වට.

ලමාතැනි : ආපහු ආවෙ නැහැ මමයි ගෙන්ව ගත්තෙ.

මුදලි : බලමු බයක් හැකක් නැතුව කියන හැටි සේරම.

ලමාතැනි : අනේ මාව මරන්න. ප්‍රේමදසට නම් අත තියන්න එපා

මුදලි : යනවද නැද්ද මා ළඟින් අහකට.

(ලමාතැනි තල්ලු කරයි)

ලමාතැනි : අපොයි..... අසරණ දරු පැටවා.

මුදලි : (යතුර ගෙන දෙර හරියි. නාරස්සනය උලුක් කරයි) එළියට..... කෑලි ..... තියන්නෙ..... නෑ.....

(පබුලිනා එනු දැක පුදුම වෙයි)

පබුලිනා : මොකද මොකද මේ සද්දෙ? මගෙ කං අඩි පැලෙන්න ගියා. අර හැට්ටෙට ටිකක් තද වැඩියි. ඒක අඳින්න ගිහින් පුටුවකුත් පෙරළුනා.

ලමාතැනි : ඇයි කර පළල් මදිද.

මුදලි : මොනවා ඒත්..... බලන්න ඕනෑ තව ඉන්නවද කියලා.

(මුදලි කාමරයට ඇතුල්වෙයි)

පබුලිනා : බයවෙන්න එපා. ප්‍රේමදස ජනේලෙං පැනල දිව්ව. මම සේරම අහගෙන හිටියා. දැනගෙනයි වැඩ කෙළේ බය වෙන්න එපා. (මුදලි පැමිනේ)

මුදලි : මං කෑ ගැහැව්වට තරහවන්න එපා. මගෙ වැරැද්ද හදිස්සි වෙලයි. කලබල වෙලයි. මට මේ නාට්‍යය ඇත්ත එකක් කියල හිතුන. ඒක නං බොරු කියන්නේ මොකටද? ලස්සනට කළා ලමාතැනි.

ලමාතැනි : මට ඔව්ව කියන්න එපා හැම තිස්සේම මාව අවිස්වාස කරනවයි මට කිසිම සැනසීමක් නැහැ.

මුදලි : ලමාතැනි තරහවෙන්න එපා. මගෙ වැරැද්ද. මම ටිකක් කලබල වුනා.

ලමාතැනි : මම හැමතිස්සෙම නරකයි මෙහෙම ජීවත්වන්නෙ කොහොමද. දවසක මාව මැරිල ගියාම සේරම ඉවරයි.

පබුලිනා : ඔන්න ඔව්ව අමතක කරල දාන්න. මොනවද මේ ලමාතැනි දෙඩවන්නෙ.

ලමාතැනි : නෑ පබුලිනා මෙහෙම ජීවත් වෙලා ඇති වැඩේ මොකද?

මුදලි : මටත් අවිස්වාස හිතෙන්නෙ නැද්ද? හරි පුදුම වීදියටනෙ ඒ වෙලාවෙ එව්ව යෙදිල තිබුනෙ.

පබුලිනා : ලමාතැනි කලබල වෙන්නෙ නැති වයැ මුදලි තුමා කෑගහපුවම. මටත් කාමරේ ඇතුළෙ ඔය සද්දෙ ඇහිල. බය හිතිල පෙරළෙන්න ගියා පුටුවකුත් එක්ක. ඇහුනෙ නැද්ද?

මුදලි : එහෙනං කිව්වෙ මේ හැට්ටයක් අඳින්න ගිහිං පුටුව පෙරලුනා කියලා.

පබුලිනා : ඔන්න කිව්ව, මේ ආයෙත් කෑගහන්න හිටිය. මුදලි තුමා කෑගහනවිදියට රට උනත් පෙරලෙන්න නැතිවයැ.

මුදලි : එහෙකොට කව්ද මේ ලියමන ලිව්වෙ.

ලමාතැනි : මේකත් මේ කොළොප්පමේ කොටසක්.

මුදලි : මොනවා.

ලමාතැනි : ඕක ලිව්වෙ ජාසොං.

මුදලි : මොනවා. ජාසොය.

ලමාතැනි : මුදලිතුමා ටිකක් කලබල කරන්න කියා.

මුදලි : මොනවා මාව මුන් විහිළුවකට අරං! මගෙ වැඩකාරයොා! මම උගන්නන්න උන්දැට හොඳ පාඩමක්.

පබුලිනා : අනේ ඕක ගනන්ගන්න එපා සමාවන්න.

මුදලි : සමාව දෙන්න! උන්දෑ ඉවරයි.

ලමාතැනි : දැන් ටිකකට ඉස්සර වෙලා ඔයා සමාව ඉල්ලුව. සමාව ඉල්ලන මිනිස්සු සමාව දෙන්නත් දැන ගන්න ඕනෑ.

මුදලි : ජේන්නෙ නැද්ද. මෙහෙම කලබල තියෙන කොට මිනිස්සුන්ට සිහියක් පොතක් තියෙනවද තේරුනාද. කෝකට උනත් මාත් එක්ක මේ වාගෙ කෝලං නටන්න එපා.

පබුලිනා : දැන් ඉතිං ඔව අමතක කරල අපි සිහි මොලේ තියෙන මිනිස්සු හැටියට වැඩ කරමු.

(මේ අතර ජාසොං පැමිනේ)

ජාසොං : අවසර මුදලි තුමා දැන් ඉතිං සේරම කටයුතු අවසානයි. මම නැකැත් හේම බලල ඉවර කළා. මම කාට කාටත් කිව බුලත් දීල. හෙට කසාදෙ වැඩ ගැන.

පබුලිනා : රෙජිස්ටර් රාළහාමිටත් කිව්වද?

ජාසොං : ඒ සේරම හරි පබුලිනා.

මුදලි : ඊට ඉස්සර වෙලා මට පොඩි කාරනයක් දැනගන්න ඕනෑ..... මේ ජාසොං දන්නවද මේක කව්ද ලිව්වෙ කියලා.

ජාසොං : (නැසුනාක් මෙන්) මුදලි තුමාගෙ පැමිණීම ගැන අපි ඉතිං බලා පොරොත්තුව ඉන්නව මහුල් උන්සවේව.

මුදලි : ඔව්! ඒක හරි ඕම ඇහුවෙ වෙන එකක්නෙ..... මං ඇහුවෙ මේ මේක ලිව්වෙ කව්ද කියල.

ජාසොං : නැකැත් පත්තරේද මුදලි තුමා.

මුදලි : නෑ මේ කැලැපත්තරේ.

ජාසොං : කැලැපත්තරයක් කා ගැන ද?

මුදලි : මේ බලන්න බැරියැ දන්නව් නැතැ කව්ද ලිව්වෙ කියල.

ජාසොං : පුදුමයි බලන්න.
මුදලි : පුදුමයක් ම තමා.
ජාසොං : හරිවැඩක් නෙ මේක කව්ද ලීවෙ.
මුදලි : කව්ද ලීවෙ කියල තමයි මටත් දැන ගන්න ඕනෑ.
ජාසොං : මං කොහොමද දන්නෙ මුදලි තුමා.

(ලමාතැනි හා පබුලිනා ජාසොංට, රහස එළිකල බව අහවන්ට තැන් කරයි)

පබුලිනා : ඇයි මතක නැති උනාද ඊයෙ ඕක ලියාපු විත්තිය?
ලමාතැනි : ඇයි මතක නැද්ද ඊයෙ ඕක තැපැල්කළා?
ලමාතැනි : ඔව්! ඉතිං.
පබුලිනා : ඇයි ඔය හැටි අමතක. මතක නැද්ද අර මුදලි තුමා උත්සෙවේට ගිය වෙලාවෙ ලමාතැනිගෙ කාමරේට එන මිනිහ ගැන?
ලමාතැනි : අර අපි හැදුව කතාව.
මුදලි : සිහියට එනවද මොනවත්?

(ජාසොංට ඉහිය හරිහැටි නොවැටහේ)

ජාසොං : නෑ. මන් දන්නෙ නෑ. මොනවද මන්ද මේ කියන්නේ.
මුදලි : ගිහිං බලාපන් අර කන්නාඩිය දිහා කොයිතරම් කැනද උඹේ ඔය ගොරහැඩි මූණ කියල. කොයිතරම් බොරු කියනවද කියල.
පබුලිනා : මේ ඔන්න ඔය බොරු අත්හැර දල කියන්න ඇත්ත. දැන් මේ කෝලම් ඉවරයිනෙ.
ජාසොං : මොනවද?
ලමාතැනි : මොනවද..... මොනවද තමයි. අපි මුදලි තුමාට කීව ජාසොං ලියුම ලියාපු විත්තිය.
ජාසොං : (අස්වැසීමට) අනේ මට වෙන මොකක් ගැනවත් කල්පනාවක් නැහැ. කසාදෙ සිහිය මිසක්. ඒක හෙට ඉවරයක් කරන කං.
ලමාතැනි : අනේ ඇත්තට ඔන්න ඔය විකාර කතා දැන් අහක දලා ජාසොංගෙ කටයුතු ගැන කතා කොරමු.
මුදලි : මොන කටයුතු ද?
ලමාතැනි : ඇයි කසාදෙ.
මුදලි : ඇයි කසාදෙට ඉස්සරවෙලා නැතිද කරුණාවතීගෙ පැමිණිල්ල ගැන තීරනයක් ගන්න? ඒක ඉවර කරන්න ඕනෑ කොයිකටත් ඉස්සර වෙලා මට මේව මොකවත් පැහැදිලි නැහැ. තේරුනාද? මට හිතෙනව මොනව හරි යටිං කෙරෙනව කියල.

(බිඳුනු මල් පෝච්චියක් රැගෙන බයියප්පු පැමිණෙයි).

බයියප්පු : මුදලි තුමා, ඔන්න මට තවත් ඉවසන්න බෑ. තේරුනාද.
මුදලි : ආ මොකද.
බයියප්පු : හැමදම මුදලි තුමා මේ එක එක ඒවා විසිකරනව ජනෙල්වලිං මල් වත්තට. අද ඔන්න මිනිහෙක්ව විසිකළා ජනේලෙං.
මුදලි : මොනවැ! කෝ ඒ මිනිහ?
බයියප්පු : මට හරියට බලාගන්න ඉස්සරවෙලා පැනල දිව්වා අස්සය වගේ. මගේ අපූරු මල් පැල වගයක්. බලන්න මේ පොඩි කරල. ඕකට කඹුරන්න එපායැ.
පබුලිනා : (ඉදිරියට පැන) හා. හා. ඒයි බයියප්පු මේ දෙඩවන්නේ නැතිව පලයන්..... උඹ මේ වෙරි වෙලා වැටිලද කොහෙද මේ ඇවිදින් ගෝරනාඩුව. පේන්නෙ නැද්ද මුදලි තුමා ඉස්සරහ. පලයන්-පලයන්.

(පබුලිනා ජාසොංට කොඳුරයි)

මුදලි : මොනවද උඹල ඔය කුටු කුටු ගගා රහස් කියන්නෙ. ඒයි අහකට වෙලා ඉන්නෙ නැතුව.
ලමාතැනි : හනේ කසාද බඳින්න ඉන්න අය කුටු කුටු ගාන්නෙ නැත්තං කවුද කුටු කුටු ගාන්නෙ.
ජාසොං : ඒයි බයියප්පු පලයං මුදලි තුමා ඉස්සරහ දෙඩවන්නේ නැතිව.
ලමාතැනි : ඔය මිනිහ දැන් වමනෙ කරාවි, පන්නන්න.
මුදලි : හා ඒකට කමක් නැහැ කියාපන් බයියප්පු කියාපන් කවුද මේ මිනිහ.
ජාසොං : (ඉදිරියට පැන) මුදලි තුමා මේ මමයි පැන්නෙ ජනේලෙං.
මුදලි : නෑ නෑ බයියප්පු කියාපං කව්ද ජනේලෙං පැන්නෙ කියල.
ජාසොං : බයියප්පුට වෙරි හින්ද මාව අඳුනගන්න බැරිවෙන්න ඇති හා! හා! (සිනාසෙයි).

මුදලි : නෑ නෑ මටනං හොඳට හෝදිසියි මේ මිනිහ ටිකක් ඔයිට වඩා කුඩයි මුදලිතුමා.

ජාසොං : ඇයි මිනිහො මිනිහෙක් උඩක ඉඳල පනින කොට මිනිස්සු දිග ඇරිල පනිනවද කොන්ද නමා ගෙන මිසක්.

බයියප්පු : මට හිතෙන්නේ මේ ප්‍රෙමදස වගේ කියල.

මුදලි : ප්‍රෙමදසය!

ජාසොං : ප්‍රෙමදස දැන් ඇති මෙලහකට බස් එකේ.

බයියප්පු : බස් එකක් පෙරලෙනව මං නං දැක්කේ නැහැ. ප්‍රෙමදසය විතරයි.

මුදලි : (ජාසොං ගෙන්) කියාපන් ඇත්ත වහාම. මොකක්ද මේ කතාව?

ජාසොං : මුදලි තුමා කලබලවෙන්නෙ නැතිව අහන්නකො. මම පබුලිනා එක්ක කතාකොර කොර කාමරේ ඉන්න කොට ඔබ තුමාගෙ සද්දෙ ඇහුන. මං දැනගත්ත මේ මේ කැලෑ පත්තරේ ගැන කේන්තියෙන් බව. මම බයේ ජනේලෙන් පැනල දිව්ව. බලන්න මගෙ කකුලත් තුවාල උනා. ඇටයක් පැනලද දන්නෙත් නෑ. ඇමැට්ටිවෙලා.

බයියප්පු : ජාසොං නම් පැන්නෙ මේ ලියමන ජාසොං ගෙන් වෙන්න ඇති වැටෙන්න ඇත්තෙ පනින කොට.

මුදලි : (වහා ලියමන ගෙන බලා) කෝ ..... ඔව්! ජාසොං..... කියමු බලන්න මොකක්ද මේ ලියුම කියල.

(ලමාතැනී රහසෙන් බලා ලියමන හදුනාගනී)

ජාසොං : ලියුමක් කීවා. මා ළඟ ලියුම් කිපයක් තිබුණා.

මුදලි : ජාසොං, මුදලි තුමා රවට්ටන්න බෑ. උඹේ අඩව් තවත් මා එක්ක අල්ලන්න බෑ.

ලමාතැනී : ඒක නෙමෙයි මට කියන්න බැරි උනා. ඇයි අර ප්‍රෙමදසට දුන්න ලියුමෙ මුදලිතුමා අත්සන් නොතිබ්බෙ. සේරම කලබලේට වැඩ.

මුදලි : (ඉවසුම් නැතිව) ලමාතැනී! මගේ වැඩ වලට ඇඟිලි ගහන්න එපා කිව නේද?

ලමාතැනී : ඇඟිලි ගහන්නෙ නැතිවයැ සිහියක් නැතිව වැඩ කරන කොට.

ජාසොං : මට ප්‍රෙමදස දුන්න මේ ලියමන ආපහු ඔබතුමා අත්සන් කරලා තිබුණෙ නැහැ කියල. ඒක වෙන්න ඇති.

මුදලි : මම මේ වලව්වට ගිනි තියනව. මගේ වැඩක් මට කරගන්න දෙන්නේ නැනේද?

මෙහෙකරු: (ඇතුල් වී) මුදලි තුමා. ගැණු එක්කෙනෙක් ඇවිත් හම්බවෙන්න.

මුදලි : කරුණාවති. එන්න කියාපන්. එන්න කියාපන්. ඒක ඉවරයක් කළාම සේරම ඉවරයි.

ජාසොං : මුදලිතුමා එක එක දේවල් පට්ටල ගන්නව. ඔන්න ඔය ඔව්ව අමතක කරල දුල මුදලිතුමා නිවාඩු ගන්න යන්න නුවරඑළි.

මුදලි : ජාසොං. උඹ මට උගන්නන්න එන්න ඕනෑ නැහැ. වරෙං මා එක්ක ඉක්මනට. (පිටවෙයි).

පබුලිනා : අනේ මදෑ. සේරම කපාපු ඉණි ගහේ. අයියෝ ළමාතැනී, මට නං හිතෙන්නෙ නෑ අපිට මේ දීගෙ කන්න පුළුවන් වේවි කියල මේ ආත්මෙ.

ලමාතැනී : බය වෙන්න එපා. මගෙ පොඩි ප්ලෑන් එකක් තියෙනව.

පබුලිනා : අනේ ඔය දැක්කෙ නැද්ද ප්ලෑන් වලට වෙච්ච දේ. අරයගෙ ප්ලෑන් වැරදිච්ච කොට.

ලමාතැනී : නෑ පබුලිනා මම ඇඳගෙන යන්නං කො පබුලිනා වගේ මල්වත්තට. එතකොට හරි.

පබුලිනා : මොනවා ඇත්තට.

ලමාතැනී : ඔව්! පබුලිනා හැබැයි මේක ජාසොංට කියන්න එපා. අපි පෙන්නමු අපේ හපන්කම; අනික් එක එහෙම ගියාම මුදලිතුමාව බෙල්ලෙන්ම අල්ලගන්න හැකි.

පබුලිනා : ඒක නං අගෙයි.

ලමාතැනී : ඔව්! පබුලිනා දන්නියෙන්නෙ මුදලි තුමාට කියන්න පබුලිනාගෙ කැමැත්ත අදරට හම්බවෙන්න.

පබුලිනා : හරි ලමාතැනී.

ලමාතැනී : හරි එහෙනම් මම පෙනෙන්න ඉන්නෙ නැහැ. පබුලිනා ගිහිං මුදලි තුමාට වවනෙ දීපං. හැබැයි මේ ගැන ජාසොංට කියන්න එපා. ජාසොං පැටඑනොත් ඔකත් හරි නොයාවි.

පබුලිනා : හරි ලමාතැනී.

(පිටවෙයි)

ලමාතැනි : අනේ මෙහෙම ජීවිතේකින් ඇති පලේ මොකක්ද. මුදලි තුමා මට මොනතරම් ආදරේ කලාද. අනේ ඒකාලෙ සිහිවෙන කොට දැන් මගෙ ජීවිතෙත් ඇති පලේ මොකක්ද.

අනේ කවදද මම එයාගෙ ආදරේ නැවතත් ලබාගන්නෙ.....

ලමාතැනි ගේ ගිය

හැර ගිය කැදැල්ලක තව උණුසුම ඇ ද් ද
කොලපත් හැලුන් රුක් සුලහට ලෙල දෙ ද් ද
සොම්රැස් පහස නොලැබී කොඳ පොබ ය ද් ද
තුරුලක් නැති හදට ඉවසීමක් ඇ ද් ද